# ලංකාවේ භාවිතා වූ මුල්ම කාසි දෙවර්ගය පිළිබඳව අධ්‍යයනයක්

එච්.එම්.එම්.එම්. හේරත්

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
maheshikam605@gmail.com

**මුඛ්‍ය පද** - ස්වස්තික කාසි, ශ්‍රී ලංකාව, හස්එබු කාසි

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මූල්‍ය ඒකකය රුපියල් ශත ලෙස හැඳින්විය හැකි අතර මෙම ක්‍රමය ආරම්භ වන්නේ 1872 ජනවාරි 1වන දින සිට යි. එසේ වුවද ක්‍රි:පූ 3 වන සියවසේ සිට වර්තමානය දක්වා අවුරුදු දෙසීයකට අධික කාලයක් පුරාවට ශ්‍රී ලංකාව තුළ කාසි භාවිතා කළ බවට ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාක්ෂි අප සතුවේ. මේ අනුව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ තුළින් පැරණි දේශීය හා විදේශීය කාසි විශාල වශයෙන් හමුවන අයුරු දැක ගත හැකිය. ශ්‍රී ලංකාවේ අතීතයේදී ගනුදෙනු අවශ්‍යතා සඳහා මුදල් භාවිත කළ බවට සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක තොරතුරු අනුව පැහැදිලි වේ. මෙම මුදල් භාවිතය සම්බන්ධයෙන් වන පැරණිතම සාධකය ක්‍රි:පූ 3 වන සියවස දක්වා දිවෙයි. අනුරාධපුර මුල් යුගයේ සිටම හස්එබු කාසි, ස්වස්තික කාසි, ලක්ෂ්මී කාසි, ආදී කාසි භාවිතා වී තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ භාවිතා කරන ලද මුල්ම කාසි දෙවර්ගය වන හස් එබූ කාසි සහ ස්වස්තික කාසි පිළිබඳව මේ තුළින් විමර්ශනාත්මක අධ්‍යයනය කෙරේ.

## ක්‍රමවේදය

ශ්‍රී ලංකාවේ භාවිත මුල්ම කාසි දෙවර්ගය වන හස් එබු සහ ස්වස්තික කාසි පිළිබඳව මේ තුළින් විමර්ශනාත්මකව තොරතුරු ඉදිරිපත් කර ඇත. මෙහිදී විශේෂයෙන් ම දත්ත ලබාගැනීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයන් හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් පදනම් කරගත් පුස්තකාල අධ්‍යනයන් සිදු කරන ලද අතරම අන්තර්ජාලය ආශ්‍රිත ව ද තොරතුරු ගවේෂණය කිරීමක් සිදුකරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ කාසි භාවිතය පිළිබඳව ඉතිහාසයේ සලකා බැලීමේදී පෙනෙන්නේ එය ක්‍රි.පූ. 5 වන සියවස තරම් ඈතට අයත් වන බව ය. මෙරට ශිලා ලේඛනයන් හා අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍රවල පුරාණ කාලයේ භාවිතා වූ ලෝහ කාසි පිළිබඳ විස්තර සඳහන් වේ. විශේෂයෙන්ම ක්‍රි.පූ. 2වන සියවසේ සිට ක්‍රිස්තු වර්ෂ දක්වා ද, පොළොන්නරු යුගයේ දී ද කාසි භාවිතය පිළිබඳව විවිධ තොරතුරු මෙම ශිලා ලේඛනවල දැක්වේ. බොහෝ විට මෙම සෙල්ලිපිවල පුරාණ කාසි පිළිබඳව සඳහන් වන්නේ කහවණුව, කහපණ, මසුරන්, රන්මසු වැනි වචන වලිනි. එසේම තඹමසු, මාසකෝ වැනි වචන වලින් ද සාහිත්‍ය මූලාශ්‍රවල කාසි පිළිබඳව තොරතුරු සඳහන් වේ. සෙල්ලිපි සහ සාහිත්‍ය මූලාශ්‍රයන්හි පුරාණයේ කාසි සඳහා භාවිතා කළ පොදු නාමයක් වෙනුවට කුරාණ, බරණ, කහපණ වැනි වචන ද භාවිතා කර ඇත. ලක්දිව මුල්ම වරට භාවිතා කළ කාසි ලෙස සැලකෙන්නේ "හස් එබූ" (Punch Mark Coin) කාසියයි. ඉන්පසු ලංකාවේ භාවිතයට ගෙන ඇත්තේ බෞද්ධ ස්වස්තික කාසියයි. ඉන්පසුව සිංහ රුව සහිත කාසි, ලක්ෂ්මී කාසි සහ රෝම කාසි ආදී වශයෙන් කාසි වර්ග භාවිතයට ගෙන ඇත. අනතුරුව කාසි අනුපිළිවෙළෙහි දක්නට ලැබෙන්නේ ක්‍රි.ව. 6 වන සියවසින් පසුව ක්‍රි.ව. 9 වන සියවස දක්වා ලංකාවේ භාවිතා වූ ඉතාමත් වැදගත් කාසි විශේෂයක් වන්නේ රන් කහවණුවයි.

ශ්‍රී ලංකාවේ මුලින්ම භාවිතා වූ කාසි වර්ගය හස් එබූ කහාපණ කාසි වන අතර ශ්‍රී ලංකාවේ කාසි භාවිතය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී නාණක විද්‍යාඥයින් ඉන්දියාවේ ඊට

සමකාලීනව භාවිතා කරන ලද කාසි පිළිබඳව අවධානය යොමු කරයි. එයට හේතුව නම් ලැබී ඇති සාධක අනුව ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ මුල්ම කාලයේ භාවිතා කර ඇත්තේ එකම වර්ගයේ කාසි වීමයි. ක්‍රි.පූ. 3, 2, 1 ආදී වශයෙන් මුල් කාලීනව මෙය සිදුවී ඇත. මෙහිදී විශේෂයෙන් ම ඉන්දියාවේ විවිධ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් තුළ ද මෙකී කාසි පිළිබඳව විවිධ තොරතුරු අනාවරණය වේ. මෙම කාසි වර්ගය විවිධ මූලාශ්‍රයන්හි විවිධ නම් වලින් හඳුන්වා ඇති අතර පුරාණ, ධරණ, කහපන ආදී නම් ඒ අතර වේ. පාලියෙන් කහපන ලෙස ද, සිංහලෙන් කහවනු ලෙස ද, සංස්කෘතයෙන් කර්ෂාපණ ලෙස ද හඳුන්වයි. නමුත් මෙහි නිර්මාණ තාක්ෂණය පදනම් කරගෙන හස් එබූ කාසි ලෙස ද හඳුන්වනු ලබයි. ප්‍රථමයෙන් ම උතුරු ඉන්දියානු ප්‍රදේශයේ නිර්මාණය කරන ලද බවට විශ්වාස කෙරෙන හස්එබූ ලංකාවට පැමිණීමට ක්‍රි.පූ. 3 වන සියවසේ අශෝක රජු හා දෙවනපෑතිස් රජු අතර පැවති දේශපාලනික හා ආර්ථික සබඳතාවය ද හේතු වී ඇති බවට මතයක් වේ. මුල් කාලීනව ශ්‍රී ලංකාවේ මෙම කාසි නිෂ්පාදනය පිළිබඳව සාධක හමු නොවන අතර දකුණු ඉන්දියාව හරහා හෝ සෘජුව ම උතුරු ඉන්දියාව හරහා ශ්‍රී ලංකාවට පැමිණ ඇත. පසුව ලංකාවේ නිෂ්පාදනය කර තිබේ.

ශ්‍රී ලංකාවේ භාවිතා වූ දෙවන කාසි වර්ගය වශයෙන් ස්වස්තික කාසි හඳුනාගත හැක. ක්‍රිස්තු වර්ෂ ආරම්භයත් සමග කාසි වල විටින් විට සංකේතය යෙදීමේ පුරුද්ද ක්‍රමයෙන් අතහැර දියුණු වීමත් සමග එකවර සංකේත කිහිපයක් එබ්බවීමට යොමු විය. මෙහිදී විවිධ සංකේත කිහිපයකින් යුතු මිටියක් සාදා එකවර සංකේත කිහිපයක් එබ්බවීමට කටයුතු කරන ලදී. මෙම කාසි අනුරාධපුර යුගයේ එනම් ක්‍රි.ව. 1-3 කාලයට අයත් වේ. මෙම කාසි තුළ අක්ෂර දක්නට නොලැබෙන අතර මෙහි ඇති විශේෂත්වය නම් හස් එබු කාසි වල මෙන් විවිධ ජන කණ්ඩායම් වෙළෙඳ ශ්‍රේණි අතට පත් වූ විට විටින් විට ඔබන ලද සංකේතයන් මෙහි දක්නට නොලැබෙන අතර මේවායෙහි දක්නට ලැබෙන සංකේතයන් එකවර නිෂ්පාදනය කරන අවස්ථාවේදීම ඔබ්බවා තිබීමයි. ඒ අනුව එකවර ක්‍රමවත් සංකේත යෙදවූ දියුණු ක්‍රමයක් මෙහි දක්නට ලැබේ. එමෙන්ම ස්වස්තික සංකේතය ප්‍රධාන වූ සංකේත කිහිපයකින් යුක්ත වීම හේතුකොටගෙන මෙම ස්වස්තික කාසි ලෙස හඳුන්වනු ලබයි. මෙකී ස්වස්තික සංකේතය බෞද්ධ ආගම හා සම්බන්ධ වෙන නිසාවෙන් එය පදනම් කරගෙන නාණක විද්‍යාඥයින් විසින් මෙම කාසි බෞද්ධ ස්වස්තික කාසි ලෙස ද හඳුන්වනු ලබයි. මෙම කාසියේ ඇති අනෙකුත් සංකේත පදනම් කරගනිමින් කාසි කොටස් කිහිපයකටද බෙදා තිබේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**

බාලසූරිය, අයි.ඩී, (2000), ***ජේතවන බිමෙන් හමු වූ අපේ කාසි 8-19***, වැලිපිල පුරාවිද්‍යා සඟරාව,

සංස්කාරක අරුණ රාජපක්ෂ සහ සමින්ද කුමාර, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

සිරිසෝම, එම්.එච්, අමරසිංහ, ජී, (1986), ***හස් එබූ කහාපණ***, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.